# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,862 — 1969 ජූලි 11 වැනි සිකුරාද — 1969.7.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් | — | පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම | 90 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම | — | බුදල් නඩු පිළිබඳ දන්වීම | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 89 | නීති අධ්‍යාපන සභාවේ දන්වීම | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම | 89 | නොතාරිස් ලැයිස්තුව | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම | — | විවිධ දන්වීම | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම | — | | |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට උතුරු පලාතේ සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1969 ක්වූ ජූලි මස 22 වන දින පෙරවරු 11 ට යාපනය මහ නගර සභා ශාලාවේ අධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියමකොට දැනුම් දෙමි.

ප්‍රැන්සිස් සිරිල් පීටර්ස්,
පිස්කල්,
උතුරු පළාත.

වර්ෂ 1969 ක්වූ ජූලි මස 4 වන දින,
යාපනය පිස්කල් කන්තෝරුවේදීය.

7-504

## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම්

### වටිනාකමක් නැති ලේඛන විනාශ කිරීම—මහේස්ත්‍රාත් උසාවි

1937 හා 1938 වර්ෂවල, ගම්පොල මහේස්ත්‍රාත් උසාවියේ පවරන ලද, යට සඳහන් නඩු වාර්තා හැර අංක 12900 සිට 14099 දක්වා වූ නඩු වාර්තා 1200, මෙම දැන්වීමේ සඳහන් දිනේ සිට තුන් මසක් ගත වූ පසු වටිනා කමක් නැති ලේඛන විනාශ කිරීමේ ආඥාපනතේ විධිවිධාන අනුව විනාශ කරන බව මින් දැනුම් දෙනු ලැබේ.

යම් කිසි නඩු වාර්තාවක් පිළිබඳ සැලකිලිමත් වන කෙනෙකුට එබඳු නඩු වාර්තාවක් විනාශ නොකරණ ලෙස පෞද්ගලිකව, නීතිඥ මහතෙකුගේ මගින් හෝ දිවුරුම් පෙත්සමක් මගින් ද, සෑහෙන කරුණු ඉදිරිපත් කිරීමෙන් ඉල්ලා සිටිය හැක.

13374, 13536, 13823, 13891, 13905, 13922, 13978.

ඇල්. අසෝක ගුණවර්ධන,
ගම්පොල මහෙස්ත්‍රාත්.

1969.7.11 වැනිදා,
ගම්පොල මහේස්ත්‍රාත් උසාවිය.

7-500

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම මුලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පිරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## තංගල්ලේ රික්වෙස්ට් උසාවියේ දී ය

වල්ගම්මුල්ලේ, අබේවික්‍රම ආරච්චිගේ බේබිනෝනා...පැමිණිලිකාරයා.

නොම්මරය 19288 එදිරිව

වල්ගම්මුල්ලේ, සාස්ත්‍රගේ යෝලිස් සිඤ්ඤෝ.........විත්තිකාරයා.

ප්‍රසිද්ධ නොතාරිස් එල්. ද එස්. ජයසූරිය මහතා විසින් සහතික කරන ලද අංක 4141 හා 66.4.21 දින දරණ ඔප්පුවෙන් පැමිණිලිකරුට උගස් කරන ලද, 67.12.24 දින දරණ නඩු තීන්දුවේ ප්‍රකාර, 69.2.7 දින දරණ උසාවි නියෝගයෙන් විකුණන ලෙස නියෝග කර ඇති, මෙහි පහත සඳහන් දේපල වලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් හා ප්‍රයෝජනයත්, රුපියල් තුන්සිය හතලිස් අටයි ශත අසූතුනක් (රු. 348.83) හා 69.1.17 දින සිට මුළු මුදල ගෙවනතෙක් රු. 288.58 කට නීති පොලියද අයකර ගැනීම සඳහා වර්ෂ 1969 ක්වූ අගෝස්තු මස 1 වැනි දින පෙ. ව. 10 පැයට එකී ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, වලගම්මුල්ලේ පිහිටි, උතුරට: අකුරුස්සෙවත්තෙ බස්නාහිර කැබැල්ල නමැති ඉඩමේ උතුරු කොටසද; නැගෙනහිරට: ඊෂ්වර දිසානායක දොන් අන්දිරිස්ගෙ ඉඩම සහ අකුරුස්සෙවත්තෙ බස්නාහිර කැබැල්ල නමැති ඉඩමේ නැගෙනහිර කොටසින් ද; දකුණට සහ බස්නාහිරට: ගොඩැල්ලෙහේනද, යන මෙකී මායිම් තුල පිහිටි ඊ 4/155 යටතේ ලියාපදිංචි කර ඇති අක්කර 2, රූඩ් 0, පර්. 31 ක් විශාල අකුරුස්සේවත්තෙ බස්නාහිර කැබැල්ල නැමැති ඉඩමේ බිම සහ වැවිලි වලින් නොබෙදූ 1/3ක් වේ.

2. ඉහතකී වල්ගම්මුල්ලේ පිහිටි උතුරට: ලොට් 157 ද; නැගෙනහිරට: ලොට් 157ඒ සහ ලොට් 159 ද; දකුණට: ලොට් 157 සී සහ බස්නාහිරට: වෙළුදගොඩ ගම්මායිම යන මෙකී මායිම් තුළ පිහිටි ඊ4/143 යටතේ ලියා පදිංචි කර ඇති අක්කර 0, රූඩ් 2, පර්චස් 25 ක් විශාල පී. පී. 403285 දරණ ගොඩැල්ලෙහේන නමැති ඉඩමේ බිම සහ වැවිලිවලින් නොබෙදූ 1/3 ක් වේ.

ගි. ගුණසිරි ද සිල්වා,
අතිරේක නියෝජ්‍ය පිස්කල්, තංගල්ල.

වර්ෂ 1969 ජූනි මස 30 වැනි දින,
තංගල්ලේ, නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේ දී ය.

7-437

---

## තංගල්ලේ රික්වෙස්ට් උසාවියේ දී ය

පල්ලත්තර, රට්ටසිං ආරච්චිගේ බබුසිං අප්පුහාමි......පැමිණිලිකාරයා

නොම්මරය 19059 එදිරිව

1. බෙලිඅත්තේ, දයානන්ද ද සිල්වා වික්‍රමනායක, 2 බෙලිඅත්තේ, මිරිස්සෙ ගල්බොක්කෙ හේවගේ සවුන්දියස් අප්පු ................................................ විත්තිකාරයෝ.

ප්‍රසිද්ධ නොතාරිස් ඞී. සේරසිංහ මහතා විසින් සහතික කරන ලද, අංක 10,120 හා 63.4.10 දින දරණ ඔප්පුවෙන් පැමිණිලිකරුට උගස් කරන ලද 1966.3.14 දින දරණ නඩු තීන්දුවේ ප්‍රකාර, 1968.3.1 දින දරණ උසාවි නියෝගයෙන් විකුණන ලෙස නියෝගකර ඇති මෙහි පහත සඳහන් දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් හා ප්‍රයෝජනයත් රු. 876.15 ක්ද, රු. 787 කට 1966.11.4 දින සිට මුළු මුදල ගෙවන තෙක් නීති පොලියද අයකර ගැනීම සඳහා වර්ෂ 1969 අගෝස්තු මස 4 වැනි දින පෙ. ව. 10 පැයට එකී ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ දකුණු ගිරුවා පත්තුවේ පුවක්දන්ඩාවේ පිහිටි උතුරට: පැඟිරි වත්තේ ලොට් එම් දරණ කැබැල්ලද; නැගෙනහිරට: අතහැරිය ලොට් 2 ද; දකුණට: පැඟිරිවත්තේ ලොට් ඕ කොටසද; බස්නාහිරට: පැඟිරිවත්තේ ලොට් ශූ කොටස යන මෙකී මායිම් තුල පිහිටි අංක ඒ 474/238 යටතේ ලියා පදිංචි කළ ලොට් එන් දරණ රූඩ් 1, පර්. 12 ක් විශාල ඉඩමේ බිම වැවිලි හා එහි පිහිටි නවරියන් උළු සෙවිලි කල ගෙයද වේ.

ගි. ගුණසිරි ද සිල්වා,
අතිරේක නියෝජ්‍ය පිස්කල්, තංගල්ල.

වර්ෂ 1969 ජූනි මස 30 වැනි දින,
තංගල්ලේ, නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේ දී ය.

7-438



## තංගල්ලේ රික්වෙස්ට් උසාවියේ දී ය

වරාපිටියේ, දොන් ඩේවිඩ් ජාලත් ගුණසේකර ...... පැමිණිලිකාරයා.

නොම්මරය 19130 එදිරිව

වරාපිටියේ, කැපිපේ සමරසේකරගේ කුලරත්න ...... විත්තිකාරයා.

ප්‍රසිද්ධ නොතාරිස් ලයනල් අමරවීර මහතා විසින් සහතික කරන ලද අංක 3572 හා 61.7.7 දින දරණ ඔප්පුවෙන් පැමිණිලිකරුට උගස් කරන ලද, 66.11.1 දින දරණ නඩු තීන්දුවේ ප්‍රකාර, 69.1.12 දින දරණ උසාවි නියෝගයෙන් විකුණන ලෙස නියෝග කර ඇති මෙහි පහත සඳහන් දේපල වලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් හා ප්‍රයෝජනයත් රුපියල් හාරසිය තිහයි ශත හැත්තෑපහක් (රු. 430.75) අයකර ගැනීම සඳහා වර්ෂ 1969 අගෝස්තු මස 7 වැනි දින පෙ. ව. 10 පැයට එකී ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ වරාපිටියේ පිහිටි උතුරට: ගොඩබැද්ද; නැගෙනහිරට: දොල; දකුණට: අමුනෙගිල්ම; සහ බස්නාහිරට: මහවත්ත යන මෙකී මායිම්තුල පිහිටි වී පැල් හතක පමණ වපසරිය ඇති වාරාකැටිදෙනිය නමැති කුඹුරේ නොබෙදූ 1/2 න් 2/7 ක් වේ.

ගි. ගුණසිරි ද සිල්වා,
අතිරේක නියෝජ්‍ය පිස්කල්, තංගල්ල.

වර්ෂ 1969 ජූනි මස 30 වැනි දින,
තංගල්ලේ, නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේ දී ය.

7-439

---

# ඌව පළාත

## බදුල්ලේ දිස්ත්‍රික් උසාවියේ දී ය

නන්දා දන්ගමුව විජේසිංහ, අංක 3, ජලාසය පාර, මහනුවර. (සී. ඩබ්. දන්ගමුව ගේ බූදල් පාලක.)

එම්බී/4041 එදිරිව

ඒ. ජේ. ඇම්. ගුණපාල බණ්ඩාර, කොස්කනුවේ වලව්ව, දන්ගමුව ................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969ක්වූ අගෝස්තු මස 6 දින පෙරවරු 11ට, ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් රු. 4,412.50 ක්, නීති පොළියද, නඩු ගාස්තු රු. 253.55 ක්ද සැම රුපියල් පහකටම ශත දහය (ශ. 10) බැගින්වූ පවුන්ඩේජ් මුදලක්ද අයකර ගැනිම් සඳහා :—

ඌව පලාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ යටි පළාත කෝරලේ දන්ගමුවේ තිබෙන වලව්වේ වත්ත නැමැති උතුරට: හණ වැටිය, පාර සහ ගස්වැටියද; නැගෙනහිරට: වේල්ල සහ පැලඉනි වැට; දකුණට සිරිල් දන්ගමුව බණ්ඩාර මහතාගේ ඉඩමේ මායිමද; බස්නාහිරට ගම්සභා පාර සහ ඇල යන මායිම් වලින් මායිම්ව ඇති කුරක්කන් කුරුණී දහඅටක වපසරිය ඇති ඉඩමේ උතුරු බස්නාහිර පැත්තේ නොබෙදූ කුරක්කන් කුරුණී හයක පමණ වපසරිය ඇති කොටසත් උලු සෙවිලිකළ ගොඩනැගිල්ලත් ද වේ.

අ. තේ. සිවලිංගම්,
ඌව පළාතේ පිස්කල් වෙනුවට.

1969 ජූලි මස 1 දින,
බදුල්ලේ පිස්කල් කාර්යාලයේදීය.

7-470

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1969

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | ... 69. 6. 6 සිකුරාද | ... 69. 5.30 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.13 සිකුරාද | ... 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.20 සිකුරාද | ... 69. 6.13 සිකුරාද | දවල් | 12.00 |
| | 69. 6.27 සිකුරාද | ... 69. 6.20 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | ... 69. 7. 4 සිකුරාද | ... 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.11 සිකුරාද | ... 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.18 සිකුරාද | ... 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.25 සිකුරාද | ... 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | ... 69. 8. 1 සිකුරාද | ... 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8. 8 සිකුරාද | ... 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.15 සිකුරාද | ... 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.22 සිකුරාද | ... 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.29 සිකුරාද | ... 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... 69. 9. 5 සිකුරාද | ... 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.12 සිකුරාද | ... 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.19 සිකුරාද | ... 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.26 සිකුරාද | ... 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... 69.10. 2 බ්‍රහස්පතින්ද | ... 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.17 සිකුරාද | ... 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.24 සිකුරාද | ... 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | 69.10.31 සිකුරාද | ... 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... 69.11. 7 සිකුරාද | ... 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | 69.11.14 සිකුරාද | ... 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.11.21 සිකුරාද | ... 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.11.28 සිකුරාද | ... 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... 69.12. 5 සිකුරාද | ... 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.12 සිකුරාද | ... 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 69.12.19 සිකුරාද | ... 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.26 සිකුරාද | ... 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩ බලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය විය.